BreastScreen
Victoria

**breastscreen.org.au** වෙතින්
හෝ **13 20 50** අමතා වේලාවක්
වෙන් කරවා ගන්න

වැඩි තොරතුරු සඳහා:
**breastscreen.org.au**

**13 14 50** අමතා BreastScreen Victoria
සම්බන්ධ කර දෙන ලෙස ඉල්ලන්න

පරිවර්තනය කල තොරතුරු:
breastscreen.org.au/**translations**

ඔබට කන් ඇසීමේ හෝ කතා කිරීමේ
අපහසුතාවයක් තිබේ නම **TTY 13 36 77**

VICTORIA State Government

වික්ටෝරියානු රජයෙන්
ලද සහාය BreastScreen
Victoria අගය කරයි

BR11/1223

2019

Sinhala | සිංහල

# ඔබේ සෞඛ්‍යයට මුල් තැන දෙන්න

## පියයුරු පරීක්ෂාවට වේලාවක් වෙන් කරවා ගන්න



**breastscreen.org.au** වෙතින්
හෝ **13 20 50** අමතා වේලාවක්
වෙන් කරවා ගන්න

BreastScreen
Victoria

## මට අවදානමක් තිබේද?

වික්ටෝරියාවේ සෑම කාන්තාවන් **7 දෙනෙක් අතරින්ම 1** කාන්තාවකට පියයුරු පිළිකා වර්ධනය වේ.

පියයුරු පිළිකා තිබෙන බොහොමයක් කාන්තාවන්ට එම රෝගය සහිත පවුල් ඉතිහාසයක **නැත**.

පියයුරු පිළිකා වර්ධනය වීමට ඇති ලොකුම අවදානම් සාධකය **වයසයි**.

50+

## පියයුරු පරීක්ෂා

නොමිලේ **පැවැත්වේ.**

ගතවෙන්නේ **විනාඩි 10ක්** පමන කාලයකි.

**වෛද්‍යවරයෙක්ගෙන් යොමුවක්** අවශ්‍ය නැත.

කරනු ලබන්නේ **කාන්තා විකිරණ ලේඛිකාවන්** විසිනි.

**වික්ටෝරියාව පුරා** ඔබට සමීපව ඇති චිකිත්සාගාරයකින් ලබා ගත හැකිය.

## පියයුරු පරීක්ෂාව යනු කුමක්ද?

පියයුරු පරීක්ෂාව (මැමොග්‍රෑම්) යනු පියයුරු වල X කිරණ ඡේයාරූපයකි. පියයුරු පරීක්ෂාවෙන් ඇඟැට දකින්නට හෝ ස්පර්ශයට නොදැනෙන තරම් ඉතා කුඩා පිළිකා සොයා ගත හැක. වේලාසනින් සොයා ගැනීම සහ වඩා හොඳ ප්‍රතිකාර හේතුවෙන් අද කාන්තාවෝ වැඩි දෙනෙක් පියයුරු පිළිකා වලින් දිවි රැකගනිති.

## මට පියයුරු පරීක්ෂාවක් අවශ්‍යද?

වේලාසනින් සොයා ගැනීම ජීවිත බේරයි.

### ඔබේ වයස 50-74 අතරද?

ඔබ සෑම අවුරුදු දෙකකටම වරක් පරීක්ෂා කර ගත යුතුය.

### ඔබේ වයස 40 ගණන් වලද නැත්නම් 75 ට වැඩිද?

ඔබ පියයුරු පරීක්ෂාවක් කරගත යුතුද යන්න දැනගැනීමට ඔබේ වෛද්‍යවරයා සමග කතා කරන්න.

### ඔබේ වයස 40 ට අඩුද?

වයස 40 ට අඩු කාන්තාවන් සඳහා පියයුරු පරීක්ෂා ප්‍රයෝජනවත් නැත.

## පියයුරු පිළිබඳව දැනුමැති වන්න

- ඔබේ පියයුරු වල ස්වභාවික පෙනුම සහ ස්පර්ශයට දැනෙන අකාරය ගැන දැනුමැති වන්න. යම්කිසි අසාමාන්‍ය වෙනස් කම් දුටුවහොත් ඔබේ වෛද්‍යවරයා හමුවන්න.
- ඔබට පියයුරු පිළිකා පිළිබඳව ඇති අවදානම සහ පරීක්ෂණයක් කරගැනීම අවශ්‍යද යන්න ඔබේ වෛද්‍යවරයාගෙන් අහන්න.

**breastscreen.org.au** වෙතින් හෝ **13 20 50** අමතා වේලාවක් වෙන් කරවා ගන්න